# 5 ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා



මනුෂ්‍යයා සත්ත්ව ලෝකයේ සෙසු සාමාජිකයන්ගෙන් වෙන් කරන කරුණු අතුරෙන් වැදගත් කරුණක් වන්නේ තම අත්දැකීම්වලින් මෙන් ම අන්‍යයන්ගේ අත්දැකීම්වලින් ද ඵල ලැබීමේ හැකියාව යි. එක් පරපුරක් ලබන මේ අත්දැකීම් ධාරණය කොට මනා ව සංවිධානය කිරීමෙන් අනතුරුව ඊළඟ පරම්පාරාවට භාර දෙනු ලැබේ. ඔවුන් සිය ලෝකය සකස් කර ගන්නේ එසේ උරුම වූ දැනුම මාර්ගයෙනි. සාම්ප්‍රදායික සමාජයන්හි නව දැනුම ලබා ගැනීම සඳහා විවිධ බාධක පැවතිණි. 19වන සියවසේ පටන් මෙරට නූතන අධ්‍යාපන ආයතන බිහිවීම ඇරඹිණි. ඒවාහි ද යම් යම් සීමා පැවති අතර බාලාංශයේ පටන් විශ්වවිද්‍යාලය තෙක් නොමිලයේ ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් මෙරට ස්ථාපනය කිරීමේ පුරෝගාමියා වූයේ ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ය. ලංකාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා වූ එතුමා 'නිදහස් අධ්‍යාපනයේ පියා' ලෙස ද ගෞරවාදරයට ලක් විය.

ගරු සභාපතිතුමනි,

"ගඩොළින් තනා තිබූ රෝම පුරවරයක් තමාට හිමි වුව ද තමා ඒ රෝම පුරවරය කිරිගරුඬවලින් නිම කළ බව මහා ඔගස්ටස් අධිරාජ්‍යයා ස්වකීය විජයග්‍රහණය ගැන ආඩම්බරයෙන් යුතුව පැවසී ය. මිල අධික ව තිබූ අධ්‍යාපනයේ මිල අඩු කළ බවත් වසා තිබූ පොතක් පරිදි අපට දිස් වූ අධ්‍යාපනය විවෘත ලියවිල්ලක් බවට පත් කළ බවත් ධනවතුන්ගේ ප්‍රවේණි උරුමයක් ව පැවති අධ්‍යාපනය දුගී දුප්පතුන්ගේ සදා කාලික උරුමය බවට පැමිණවූ බවත් සාඩම්බරයෙන් පැවසීමට රාජ්‍ය මන්ත්‍රණ සභාවට හැකි වූ විට ඒ ආත්ම වර්ණනාව ඔගස්ටස් අධිරාජ්‍යයාගේ ආත්ම වර්ණනාවට වඩා කෙතරම් ශ්‍රේෂ්ඨ ද?"

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දී මේ අදහස් පළ කෙළේ ජාතික අධ්‍යාපනයක උරුමය ලාංකේය දරුවන්ට අත් කර දුන් සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා ය.

ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර උපන්නේ 1884 ඔක්තෝබර් 13 වැනි දා අම්බලන්ගොඩ රන්දොඹේ ගමෙහි ය. ඔහුගේ පියා දොන් ඩැනියෙල් විජේකෝන්

කන්නන්ගර, කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළයට අයත් ලූල්බද්දාවෙහි වැසියෙකි. මව එමලි විජේසිංහ හික්කඩුවේ වැවල වීබදූ වලව්වේ උපත ලැබූවා ය. සහෝදර සහෝදරියන් පස් දෙනකුගෙන් යුත් පවුලේ දෙවැනියා වූ ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් දරුවා මූලික අධ්‍යාපනය ලැබුවේ අම්බලන්ගොඩ රන්දොඹේ වෙස්ලියන් උසස් පාසලෙනි.

දොළොස් හැවිරිදි වියෙහි පසු වන විට පියාගේ රැකියාව අහිමි වීම නිසා පවුලේ ජීවිකාව ගෙන යෑමට මේ දරුවාට බලවත් අරගලයක් කිරීමට සිදු විය. ෆවුන්ඩේෂන් ශිෂ්‍යත්වය දිනා ගනිමින් ගාල්ලේ රිච්මන්ඩ් විදුහලට ඇතුළු වීමට වරම් ලැබීම ඔහුට 19වන සියවස අවසාන භාගයේ පරිපූර්ණ හා විධිමත් අධ්‍යාපනයක් ලැබීමට මං පාදන සිදුවීමක් විය.

මෙතෙක් ධනවත් පවුල්වල අයට සීමා වී තිබූ උසස් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ක්‍රිස්ටෝපර් විලියම් දරුවාට හිමි වීම ඔහුගේ ජීවිතයේ මෙන් ම ලංකා ඉතිහාසයේ ද ඓතිහාසික සිදුවීමක් විය. දීප්තිමත් ශිෂ්‍යයකු බවට පත් වූ ඔහු රිච්මන්ඩ් විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී වැඩි ම ත්‍යාග ගණනක් දිනා ගනිමින් සිය සහජ බුද්ධි මහිමය ප්‍රදර්ශනය කිරීමට සමත් විය.

කේම්බ්‍රිජ් සීනියර් විභාගයට පෙනී සිටි එතුමාට හොඳ ම ශිෂ්‍යයාට ලැබෙන ත්‍යාගය හිමි වූවා පමණක් නො ව, 1902 දී අංක ගණිතය විෂයයෙන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් ම ප්‍රථම ස්ථානය ද හිමි විය. කේම්බ්‍රිජ් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර (සීනියර්) විභාගය සමත් වූයේ දැවැන්තයන් අතර බුද්ධි සටනට නොබිය ව මුහුණ දෙමිනි. එතුමාගේ ශාස්ත්‍රධරත්වය විෂය විෂයාන්තර වශයෙන් කැපී පෙනුණේ බාහිර ක්‍රියාකාරකම්හි දක්වන ලද විශිෂ්ටත්වය මත යි. ශිෂ්‍ය අවධියේ දී ක්‍රීඩා, නාට්‍ය, කථික ආදි අංශවලින් දක්වන ලද කුසලතාව ඔහුගේ වැඩිහිටි ජීවිතය විදහා දක්වන්නක් විය.

කන්නන්ගර මහතා තම මවු පාසල වූ රිච්මන්ඩ් විද්‍යාලයෙහි ම ගණිතය පිළිබඳ ගුරුවරයකු ලෙස වෘත්තීය ජීවිතයට ප්‍රවිෂ්ට විය. මොරටුවේ වේල්ස් කුමර විද්‍යාලය, මෙතෝදිස්ත විද්‍යාලය, වෙස්ලි විද්‍යාලය වැනි ප්‍රසිද්ධ පාසල්වල සේවය කළ ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් තරුණයා, 1910 දී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ සේවයට පිවිසියේ ය. නීතිඥයකු වශයෙන් එතුමා ආරම්භයේ පටන් ම සාර්ථක ලෙස කටයුතු කළ බව පිළිගැනේ.

සිංහල, පාලි හා සංස්කෘත යන භාෂාත් බුදු දහමත් හැදෑරීමෙහි නිරත විය. මේ කාර්යාවලිය එතුමාගේ ජාති මමත්වය හා දේශප්‍රේමය පිළිබිඹු කරන අවස්ථා සේ සැලකේ.

මේ වන විට දිවයින පුරා පැතිරෙමින් පැවති ජාතික නිදහස් ව්‍යාපාරයේ ක්‍රියාකාරීන් වන ඇෆ්. ආර්. සේනානායක, සර් ඩී. බී. ජයතිලක, ආතර් වී. දියෙස් සහ පියදාස සිරිසේන ආදීන් සමඟ එක්වෙමින් අමද්‍යප ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස එතුමා ජාතික නිදහස් ව්‍යාපාරයට සම්බන්ධ විය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ඇතුළත වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ලබා ගැනීමේ අරමුණින් 1919 දී පිහිටුවන ලද ලංකා ජාතික සංගමයට සම්බන්ධ වූ කන්නන්ගර මහතා ආරම්භයේ දී සංගමයේ ගාලු ශාඛාවෙහි නියෝජිතයා ලෙස එහි විධායක කාරක සභාවට තෝරා ගන්නා ලදි. 1923 මහා මැතිවරණයෙන් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ ගාල්ල ආසනයෙහි මන්ත්‍රී ධූරය ලබා ගැනීමට හැකි වීම එතුමාගේ දේශපාලන ජීවිතයේ සන්ධිස්ථානයකි. නැවත 1924 දී ද ගාල්ල ආසනයේ මන්ත්‍රී ධූරය දිනා ගැනීමට හෙතෙම සමත් විය. එතැන් සිට 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාව විසුරුවා හැරීම තෙක් එතුමා ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයෙක් විය. 1930 දී එතුමා

ලංකා ජාතික සංගමයේ සභාපති පදවියට තෝරා ගැනුණු අතර 1947 තෙක් එම පදවියෙහි කටයුතු කළේ ය.

ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ යටත්විජිත පාලනය තියුණු විවේචනයකට ලක් කළ අය අතර එතුමා ප්‍රමුඛයෙකි. අදහස් අර්ථවත් ව හා තාර්කිකව ඉදිරිපත් කිරීම හේතු කොට ආණ්ඩුකාරයා පවා ඒවාට ගරු කළ බව සඳහන් වේ.

කන්නන්ගර මැතිතුමාගෙන් මෙරටට ඉටු වූ විශිෂ්ටතම සේවය නිදහස් අධ්‍යාපන ක්‍රමය බව නිසැක කරුණකි. එහි මූලික අරමුණ වූයේ රජයේ පරිපාලනයට යටත් පොදු අධ්‍යාපන ක්‍රමයක් පිහිටුවා ගැනීම ය. එමගින් අධ්‍යාපනයේ දොරටු සියලු දෙනාට විවෘත කර දිය හැකි විය. 1944 මැයි 30 දින රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කළ අධ්‍යාපන සංශෝධන පනත 1945 ඔක්තෝබර් මස 01 දින යථාර්ථයක් බවට පත් විය. එදින එතුමා කළ කතාව එතුමාගේ සමාජ ජීවිතය තුළ කරන ලද ශ්‍රේෂ්ඨතම කතාව ලෙස පිළිගැනේ. එම කතාවට සවන් දී සිටි ඉන්දීය රජයේ නියෝජිතයා වූ ඇම්. ඇස්. අනී මහතා එතුමා දෑතින් අල්ලා ගෙන පැවසුවේ "ඔබ ඉන්දියාවේ සිටියේ නම් දෙවියකු සේ සලකා වන්දනා කරනු ඇත" යනුවෙනි. අපේ සිංහලයකු පිළිබඳ විදේශිකයකුගේ මුවින් ගිලිහුණු එම ප්‍රකාශයෙන් හෙළි වන්නේ කන්නන්ගර චරිතය කෙතරම් ශ්‍රේෂ්ඨ ද යන්න නොවේ ද?

පවත්නා ක්‍රමයේ ඇති අඩුලුහුඬුකම්, අසමානතා හා අයුක්ති ඉවත් කරමින් සමාජ, ආර්ථික, ආගමික හා වාර්ගික ආදි කිසිදු භේදයකින් තොර ව සෑම ළමයකුට ම සම අවස්ථා සැපයීම සඳහා උපයෝගි කර ගත හැකි අධ්‍යාපන ක්‍රමයක් පුළුල් දර්ශනයක් පාදක කොට සකස් කිරීමේ අවශ්‍යතාව මතු වී තිබුණි.

"යටත්විජිත පාලකයන් විසින් ඔවුන්ගේ පාසල් මගින් අපගේ ආගමට, සංස්කෘතියට හා සිරිත්විරිත්වලට අතිශයින් හානිකර වූ ද මේ රටට සම්පූර්ණයෙන් ම පරිබාහිර වූ ද අපගේ දේශීය බුද්ධියට හා දෘෂ්ටියට නොගැළපෙන වැඩපිළිවෙළක් එම ජනතාව අතර බලහත්කාරයෙන් පටවනු ලැබ ඇත."

එතුමාගේ මෙම ප්‍රකාශය එවකට පැවති අධ්‍යාපන ක්‍රමය මගින් දේශීයත්වය කෙරේ කරන ලද බලපෑම හා පීඩනය කෙතරම් ද යන්නට සාධක සපයයි. මෙහි දී එතුමාගේ දර්ශනය ජාතික අවශ්‍යතාව සහ දේශීය ප්‍රතිපත්ති සම්පාදනය කෙරේ කෙතරම් කැප වීමකට යොමු කර තිබුණා ද යන්න පැහැදිලි ය.

එතුමාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා අතර,

- ⋆ **සියලු ම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් නොමිලයේ දීම**
- ⋆ **ග්‍රාමීය පාසල් රාශියක් බිහි කිරීම**
- ⋆ **අධ්‍යාපනය සියලු ගාස්තුවලින් නිදහස් කිරීම**
- ⋆ **ඉංග්‍රීසි පාසල්වල මවුබස භාවිතයට අනුබල දීම**
- ⋆ **ශාස්ත්‍රීය හා වෘත්තීය විෂය ධාරාවලින් යුත් මධ්‍ය විද්‍යාල රැසක් පිහිටුවීම**
- ⋆ **අධ්‍යාපන චින්තාවලිය තුළ ආහාර නිෂ්පාදනයට උපරිම අවධානයක් යෙදීම**

යන අංග විශේෂ වැදගත්කමක් උසුලයි. විවිධ බලවේගයන්ගෙන් නිදහස් අධ්‍යාපන ක්‍රමයට එල්ල වූ දැඩි විරුද්ධවාදීකම්වලට මුහුණ දීමට ආචාර්ය කන්නන්ගර මහතාට සිදු විය. නිදහස් අධ්‍යාපනය කඩාකප්පල් කිරීම සඳහා විවිධ පාර්ශ්ව ඉදිරිපත් වූයේ ය. එහෙත්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

එතුමා නිර්භීත ව සියල්ලට මුහුණ දුන්නේ ය. නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රබල වූත්, සංවේදී වූත්, ව්‍යාපාරයක් රට පුරා ගෙන යෑමට එතුමාට සිදු විය.

1931 සිට 1947 දක්වා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පූර්ණ කාලය තුළ ම අධ්‍යාපන ඇමතිවරයා ලෙස එතුමා සේවය කළේ ය. අධ්‍යාපන ඇමතිවරයා ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉතා වටිනා වෙනස්කම් රැසක් ඇති කිරීමට කටයුතු කෙළේ ය. ස්වභාෂා පාසලේ ඉංග්‍රීසි ඉගැන්වීම හා ඉංග්‍රීසි මාධ්‍ය පාසල්හි සිංහල හෝ දෙමළ ඉගැන්වීම අනිවාර්ය කිරීම ඉන් එක් පියවරකි. හොඳ පාසල් ගමට ගෙන ඒමේ අරමුණින් එක් ඡන්දදායක දිස්ත්‍රික්කයක එක බැගින් මධ්‍ය මහා විද්‍යාල පිහිටුවීම නිදහස් අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිඵලයකි. එමගින් වඩාත් ප්‍රතිලාභ සැලසුණේ ග්‍රාමීය සිසුන්ට යි. මධ්‍ය විද්‍යාලවලට පිවිස ඉගෙනුම ලැබූ දරුවෝ විශ්වවිද්‍යාලය තෙක් නිදහස් අධ්‍යාපනය ලැබීමේ අයිතියේ උපරිම ඵල භුක්ති වින්දෝ ය. ග්‍රාමීය ප්‍රදේශයන්හි දක්ෂ දරුවන්ට සමාජයේ ඉහළ ස්තරවලට සම්ප්‍රාප්ත වීමේ හිණිමග මධ්‍ය මහා විද්‍යාල විය. දුප්පත් ශිෂ්‍යයන් සඳහා විශ්වවිද්‍යාලය තෙක් අධ්‍යාපනය ලබා ගැනීමට ආධාර දෙන ශිෂ්‍යත්ව ක්‍රමයක් ද ආරම්භ කෙරිණි. මූලික අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා ම නොමිලයේ ලැබීමත් සමග එතෙක් ධනය හා වරප්‍රසාද හිමි කොටස්වලට සීමා වී තිබූ උසස් අධ්‍යාපනයේ දොරටු පොදු ජනයාට ද විවෘත විය.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ මුල් සාධකය ගුරුවරුන් බව පිළිගත් එතුමා යහපත්, කැප වූ දක්ෂ ගුරු පරපුරක් ඇති කිරීමේ ලා පුරෝගාමී විය. උපකෘත පාසල්වල ගුරුවරුන්ට ඍජුව ම වැටුප් ගෙවීම ආරම්භ කිරීම මෙන් ම විවිධ වූ අධ්‍යාපන පටිපාටිවලට අනුගත ව ඉතා කාර්යක්ෂම ලෙස ගුරුවරුන් විශාල ප්‍රමාණයකින් පුහුණු කිරීම නිදහස් අධ්‍යාපන ක්‍රමයේ සාර්ථකත්වය තහවුරු කිරීමකි. මේ සඳහා නව මාදිලියේ ගුරු අධ්‍යාපන විද්‍යාල පිහිටු වන ලදි. ගුරුවරුන්ට පුහුණුවක් නොව අධ්‍යාපනයක් ම ලබා දීම එහි පරමාර්ථය විය. පාසල් දරුවන් සඳහා දිවා ආහාරය සැපයීම ද ශිෂ්‍යයන්ගේ කායික හා මානසික වර්ධනයත් සෞඛ්‍ය තත්ත්වයත් නගා සිටුවීමට ගන්නා ලද ක්‍රියා මාර්ගයකි. පාසල් අධ්‍යාපනය මෙන් ම පිරිවෙන් අධ්‍යාපනය දියුණු කිරීම පිළිබඳ ගෞරවය ද එතුමාට හිමි විය යුතු ය.

පාසල් අධ්‍යාපනට ගෘහ කර්මාන්ත හා ග්‍රාමීය වෘත්තීය අධ්‍යාපන ක්‍රම ඇතුළත් කිරීම රැකියා අංශයට පිළියමක් ලෙස බලපෑවේ ය. මෙය හුදු අත්කම් ඉගැන්වීමක් නොව ශිෂයාගේ නිර්මාණශීලි භාවය අවදි කිරීමක් ද විය. වෘත්තීය විෂයන්ට අමතර ව ගුරුවරුන්ට සංගීතය, නාට්‍යය හා නැටුම් කලාව ඉගැන්වීම කෙරෙහි ද අවධානය යොමු කරන ලදි. ඒවා ද හුදු විනෝදාස්වාදය නොව අධ්‍යාපනික වටිනාකමක් ඇති විෂය බවට මෙමගින් පිළිගැනීමක් ඇති විය.

අවුරුදු හතළිහක් ක්‍රියාකාරී දේශපාලනයෙහි ද අවුරුදු විසි අටක් ව්‍යවස්ථාදායකයෙහි මන්ත්‍රීවරයකු ව ද අවුරුදු විස්සකට වැඩි කලක් අමාත්‍යවරයකු ලෙස ද කන්නන්ගර මහතා කළ සේවය ලංකා ඉතිහාසයේ විශේෂ වැදගත්කමක් සහිත පරිච්ඡේදයකි. 1923 දී දේශපාලනයට පිවිසියේ සැලකිය යුතු ධනයක් ඇති පුද්ගලයකු ලෙස වුව ද දේශපාලනයෙන් සමු ගන්නා විට කන්නන්ගර මහතාට කිසිදු ආදායම් මාර්ගයක් නොතිබුණි. මෙය එතුමා අවංක දේශපාලනඥයකු බව කියා පාන සාධකයකි. එතුමාගේ ජීවිතයේ අවසන් කාලය ගත කළේ රජයෙන් ලැබුණ ආධාර මුදලකිනි. අවුරුදු 85ක් දිවි ගෙවූ එතුමා 1969 සැප්තැම්බර් 23 දින දිවංගත විය.

නිදහස් අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දීමෙන් පසුවත් දිවයිනේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගණනාවක් සිදු විය. සියලු ම පාසල් රජයේ පාලනයට ගැනීම ඒ අතරින් ප්‍රධානතම වූවකි. අධ්‍යාපනය දියුණු කිරීමට පොත් පත් අනිකුත් පහසුකම් සුලබ කිරීමක් රටේ සමාජ සංස්කෘතික පදනම මෙන් ම වෙනස් වන ලෝක අවශ්‍යතා ද අනුව විෂය නිර්දේශ සකස් කිරීම හා නව ඉගැන්වීම් ක්‍රම හඳුන්වා දීමත් මගින් එය ඉදිරියට ගමන් කරයි. මේ අධ්‍යාපන ප්‍රගතිය පසුබිමෙහි සිටින දැවැන්ත හෙවනැල්ල කන්නන්ගර මහතා ය. නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල භුක්තිවිඳින සෑම පුරවැසියෙක් ම එතුමාට ණයගැති වෙයි.

## අවබෝධය

1. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ජනතාව අතර ජනප්‍රිය වූයේ කවර ගෞරවාන්විත නාමයකින් ද?
2. එතුම ලංකා ජනතාවට ලබා දුන් දායාදය ලෙස සැලකෙන්නේ කුමක් ද?
3. එතුමාගේ චරිතය ඇසුරෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් නම් කරන්න.
4. එතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති කළ වෙනස්කම් තුනක් නම් කරන්න.
5. නිදහස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වූ වර්ෂය කුමක් ද?

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් පදවල අර්ථ ලියන්න.**

   i. ජාති හිතෛෂී -
   ii. පරිවර්තනය -
   iii. කෞශල්‍ය -
   iv. ශාස්ත්‍රධරත්වය -
   v. ස්වාධීනත්වය -

2. **පහත දී ඇති වචන සඳහා සමාන වචන පාඩමෙන් සොයා ලියන්න.**

   i. උත්සාහවන්ත -
   ii. උතුම් -
   iii. නව එළියක් -
   iv. චරිතයක් -
   v. ප්‍රදේශ -
   vi. අයිතිවාසිකම් -
   vii. දිළිඳු -

## ප්‍රායෝගික අභ්‍යාස

1. මෙම පාඩම නිශ්ශබ්ද ව කියවන්න.
2. 'මිල කළ නොහැකි මුතු ඇටය' යන නමින් හැඳින්වෙන නිදහස් අධ්‍යාපන ක්‍රමය පිළිබඳව පාසලේ උදය රැස්වීමේ දී කථාවක් කරන්න.
3. 'නිදහස් අධ්‍යාපනයේ වැදගත්කම' යන මැයෙන් රචනයක් ලියන්න.
4. ලංකාවේ තවත් මෙවැනි ශ්‍රේෂ්ඨ චරිත පිළිබඳ කරුණු එක්රැස් කරන්න.

### ආශ්‍රිත ග්‍රන්ථ


★ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල නොනිමි කර්තව්‍යය (2011)
ජාතික අධ්‍යාපන ආයතනය

★ ලංකාවේ අධ්‍යාපනය - සියවස ප්‍රකාශනය, 2 කාණ්ඩය (1969)

★ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය (1796 - 1965)
කේ. එච්. එම්. සුමතිපාල (පළමු මුද්‍රණය 1993)